# කැකිරාව ඉපලෝගම නබා විහාරයට අයත් අප්‍රකාශිත ශිලා ලේඛනයක් පිළිබඳ අධ්‍යයනයක්

ඊ.එම්. ප්‍රතිභා විරාජිනී ඒකනායක[28]

---

කැකිරාව ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් අංක කුංචිකුලම ග්‍රාම නිලධාරී වසමට අයත්ව පිහිටි නබා විහාරය පුරාවිද්‍යාත්මක සාධකවලට අනුව අනුරාධපුර යුගයේ මුල් සමයට අයත් වන බව පෙනී යයි. එම විහාර භූමියෙහි අනුරාධපුර යුගයේ අවසන් සමයට අයත් වන ශිලා ලිපි 02ක් දැක ගත හැකි ය. මෙම ලිපි මෙතෙක් ප්‍රකාශයට පත් ව නොමැති අතර එක් ලිපියක් බෙහෙවින් විනාශයට ගොස් ඇති අතර අනෙක් ලිපිය කියවා ගත හැකි මට්ටමෙහි පවතී. එම ශිලා ලේඛනය පිළිබඳව මෙම පර්යේෂණ පත්‍රිකාව මඟින් අධ්‍යයනයක් කරනු ලැබේ.

පෙළ

01. සි සිරි සඟ්බොයි
02. මපුර්මුකා සත්වන්
03. නෙ වෙසැඟැපුර දොළො
04. ස් වක් දවස් පිනට දුන්
05. නක්කාමිද් පස්විසි
06. නැළිය කැ බත් කසුගෙ හු
07. දුනට් පුදන්දු කොට් තිස් ක
08. ළන්දක් රන් දෙමි දුන්මි
09. මෙ විහනස කළ කෙනෙක්
10. බුදුනට් දහමට් සඟු (නට්)
11. දොහයි මෙකුමැ කළ වෙහෙර
12. බත් ගෙට ගිවුළැ (පුදයට්)
13. දුන් රන් තුදුස් කළන්දි (න්දී)
14. (බම්බ දෙයිට්) දුන් (පුදයි)

අන්තර්ගතය :-

පේළි 14 කින් යුත් මෙම ශිලා ලේඛනයෙහි සිරිසඟබෝ රජකෙනෙකුගේ අභිෂේකයෙන් සත්වන වර්ෂයෙහි ප්‍රකාශයට පත් කොට ඇත. බුද්ධ ප්‍රතිමා ගෘහයකට විසිපස් නැළියක බත් පූජා කිරීමත්, එම පුද පිළිවෙල විනාශ නොකළ යුතු බවත් කියවෙන මෙම ලිපිය අනුරාධපුර යුගයේ දේශපාලන, ආර්ථික තොරතුරු අනාවරණය කෙරෙන ලිපියක් ලෙස හැඳින්විය හැකිය.

ප්‍රමුඛ පද - නබාවිහාරය , පල්ලේකාගම, අනුරාධපුර යුගය, සිරිසඟබෝ රජ, නැළිය

---

[28] ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.